**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය - 2016**

**-----------------------------------------------**

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01

(i) ප්‍රමිතයේ 48 ඡේදයට අනුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර, වත්කම් හා වගකීම් හිලව් නොකල යුතු වුවත් ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.34,734,817 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ ඇතුළත් රු.170,387 ක හර ශේෂයක් අඩුකර දක්වා තිබීම හේතුවෙන් ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම් ශේෂය එම අගයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ii) ප්‍රමිතයේ 76 (ඇ) වගන්තිය පරිදි වාර්තාකරණ දිනෙන් පසුව මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන වත්කම්, ජංගම වත්කම් යටතේද අනෙකුත් සියලු වත්කම් ජංගම නොවන වත්කම් යටතේ දැක්විය යුතු වුවද, රු.18,684,591 ක් වූ මුළු ආපදා ණය ශේෂයම ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.14,904,369 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 6 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2** **පැහැදිලි නොකළ වෙනස්කම්**

ආයතනය විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට වෛද්‍ය සහතික නිකුත් කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 7,305,478 ක් අයවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු මුදල රු. 8,352,322 ක් වූයෙන් ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ ගිණුම් හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගිණුම් අතර රු.1,046,844 ක වෙනසක් පෙන්නුම් කෙරුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සහ 2012 වර්ෂ වෙනුවෙන් මෙට්‍රොපොලිටන් බස් සමාගමෙන් වෛද්‍ය ආයතනය වෙත අයවිය යුතු රු.742,312 ක් විගණිත දිනය වූ 2017 ජුනි 30 වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංගම ප්‍රධාන කාර්යාලයෙන් හා කළුතර රියදුරු පුහුණු පාසලෙන් වෛද්‍ය ආයතනය වෙත පිළිවෙලින් රු.7,305,478 ක් හා රු. 5,889,022 ක් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයවිය යුතුව තිබුණු අතර එම වටිනාකමින් පිළිවෙලින් රු.3,125,056 ක් හා රු. 2,988,254 ක් දින 650 කට වඩා පැරණි ශේෂ විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බස් ප්‍රවේශපත්‍ර ගාස්තු හා ආරක්ෂක ගාස්තු ලෙස වෛද්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට ගෙවිය යුතු ලෙස ගිණුම්වල පිළිවෙලින් රු. 9,595,290 ක් හා රු. 17,734,076 ක් දක්වා තිබුණු අතර එම බස් ප්‍රවේශපත්‍ර ගාස්තු හා ආරක්ෂක ගාස්තු මුදලින් පිළිවෙලින් රු. 1,470,832 ක් හා රු. 5,576,893 ක් දින 650 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 47 වගන්තිය සහ 1985 අංක 1 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධනය) පනතේ 9 (2) වගන්තිය හා 1980 අංක 16 දරන සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල් පනතේ 44 වගන්තිය | අර්ථසාධක අරමුදලේ හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලේ දායක මුදල් ගණනය කිරීමේදී අන්තර් දීමනා හා විශේෂ දීමනා අදාළ කර නොගත යුතු වූවද එම දීමනා අදාළ කරගෙන දායක මුදල් ගණනය කිරීම නිසා සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තියන්ගේ භාර අරමුදල වෙත සමාලෝචිත වර්ෂයට අදාළව පිළිවෙලින් රු.5,648,901 ක් හා රු. 1,412,225 ක් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වෙනි වගන්තිය හා 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | ආයතනය සතු මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් වෛද්‍ය ආයතනය විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත්වල පිළිවෙලින් රු.78,423,506 ක් හා රු.635,895,811 ක් ආයෝජනය කර තිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීර් 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සෞඛ්‍ය අමාත්‍යාංශය නිකුත් කර තිබූ චක්‍ර ලේඛ පදනම් කර ගනිමින් වෛද්‍යවරුන්ට හා සෞඛ්‍ය වෛද්‍ය සේවයේ නිලධාරීන්ට වර්ෂය තුලදී රු. 3,995,040 ක දීමනා ගෙවා තිබුණි. |

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
------------------------------

| | |
|---|---|
| (i) 2015 මාර්තු 26 දිනැති අංක 07/2015 දරන චක්‍රලේඛය | ආයතනය විසින් චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව නිලධාරීන් වෙත වාරික 10 කින් අයකර ගැනීමේ පදනම මත රු. 30,000 ක උත්සව අත්තිකාරම් ලබා දීමට අනුමැතිය දී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී රු. 4,210,500 ක් වැඩිපුර උත්සව අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (ii) 2014 දෙසැම්බර් 29 දිනැති අංක 29/2014 දරන චක්‍රලේඛය | රජයේ නිලධාරීන්ට ලබාදෙනු ලබන විශේෂ අත්තිකාරම් මුදල රු.4,000 ක් වුවත් එම මුදල ඉක්මවා රු.25,000 ක් දක්වා අත්තිකාරම් මුදල් ලබා දී තිබුණි. ඒ අනුව 2016 වර්ෂය තුළදී විශේෂ අත්තිකාරම් ලෙස රු. 2,746,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය
---------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 281,778,132 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 249,514,250 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 32,263,882 කින් වර්ධනය වී තිබුණි. පරිපාලන වියදම් රු. 30,019,698 කින් වැඩි වුවද වෛද්‍ය සේවා ආදායම රු. 45,814,543 කින් හා ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් පොලී ආදායම රු.30,999,663 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ රු.13,979,213 ක ඌනතාවයක් පැවතියද 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අතිරික්තයක් පැවතුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු.91,499,130 ක් වූ ආයතනයේ ධන දායකත්වය 2016 වර්ෂයේදී රු.580,079,715 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

----------------

(අ) 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3 වන වගන්තියට අනුව ආයතනයේ කර්තව්‍යයන් පහත දැක්වේ.

(i) බරවාහන ඇතුළු සියළු වර්ගවල මෝටර් වාහන පදවන හෝ ධාවනය කරන රියදුරන්ට හා ධාවකයින්ට වෛද්‍ය සේවා සහ ආධාර සැලසීම, ශාරීරික හා මානසික යෝග්‍යතාවය පරීක්‍ෂාකර සහතික ලබාදීම හා නිර්දේශ ලබාදීම.

(ii) කවර හෝ වර්ගයක මෝටර් වාහනවලට අදාළ අනතුරු හා සම්බන්ධ අවස්ථාවලදී වෛද්‍ය සේවා හා ආධාර සැලසීම, ගෙවිය යුතු වන්දි හෝ අලාභ ප්‍රමාණය පිළිබඳ උපදෙස් හා විශේෂ ගුරු උපදේශ ලබාදීම.

(iii) ආයතනයේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා සියළුම දිස්ත්‍රික්ක පළාත්වල සුදුසු වෛද්‍ය නිළධාරී මණ්ඩලයක් පත් කිරීම, කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම.

(iv) සියළු විස්තරවලට අයත් මෝටර් වාහන, ශාරීරිකව හෝ මානසික යෝග්‍ය හා ප්‍රවීණ තැනැත්තන් විසින් පමණක් ධාවනය කරනු ලබන හෝ පදවන ලබන බවට ආයතනය විසින්ම හෝ වෙනත් නියෝජ්‍යායතන විමසා හෝ වගබලා ගැනීම.

(v) අදාළ ක්‍රියාත්මක කිරීම් බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු, ප්‍රවාහන වෛද්‍ය කටයුතුවල ප්‍රමිති සකස් කිරීම, සීමා නියම කිරීම.

(ආ) ඉහත කාර්යයන් අතරින් බර වාහන ඇතුළු සියළු වර්ගවල මෝටර් වාහන පදවන හෝ ධාවනය කරන රියදුරන්ට හා ධාවකයින්ට වෛද්‍ය සේවා සහ ආධාර සැලසීම, කවර හෝ වර්ගයක මෝටර් වාහනවලට අදාළ අනතුරු හා සම්බන්ධ අවස්ථාවලදී වෛද්‍ය සේවා හා ආධාර සැලසීම, කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම, අනතුරු අවස්ථා සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි හා අලාභ ප්‍රමාණය පිළිබඳ උපදෙස් හා විශේෂ ගුරු උපදේශ ලබාදීම, අදාළ ක්‍රියාත්මක කිරීම් බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු ප්‍රවාහන වෛද්‍ය කටයුතුවල ප්‍රමිත සකස් කිරීම, සීමා නියම කිරීම, පෞද්ගලික බස්රථ සමාගම්වල සේවයේ නියුතු රියදුරන්ට හා ධාවකයින්ට වෛද්‍ය ආධාර ලබාදීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය ආයතනයේ රථ ගාල සඳහා වෙන්කර තිබූ ඉඩමේ කොටසක් ටෙන්ඩර් කැඳවීමකින් තොරව පුද්ගලික ආයතනයකට 2012 වර්ෂයේ සිට කුලී පදනම මත වාහන නැවැත්වීම සඳහා ලබාදී තිබුණු අතර ඒ සඳහා ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි. එමෙන්ම පසුගිය වර්ෂයේදී රු. 1,100,000 ක් වූ කුලී ආදායම සමාලෝචිත වර්ෂයේදී රු. 990,000 ක් දක්වා අඩු වී තිබුණද ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ජංගම ගිණුම් 04ක මාසිකව රු. 58,277,640 කට අධික අතිරික්ත මුදල් ශේෂයන් වර්ෂය පුරා පොලී ආදායමක් රහිතව නිශ්ක්‍රීයව පවත්වාගෙන ගොස් තිබුණි. එම අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) වෛද්‍ය ආයතනය විසින් ජාතික ගමනාගමන මණ්ඩලයට ගොඩනැගිල්ලක් කුලියට දී ඒ සඳහා 2004 වර්ෂයට පෙර සිටම මාසිකව රු.5,000 ක කුලියක් අයකරමින් තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්ශ්වය විසින් ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණු අතර තක්සේරු වාර්තාවක් ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමෙන් මාසික කුලී මුදල වර්තමාන වෙළඳපොළ වටිනාකම අනුව සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

-----------------

වෛද්‍ය ආයතනයේ ගොඩනැගිල්ලේ දෙවන මහල ආයතනයේ කාර්යාල කටයුතු පවත්වාගෙන යාම සඳහා 2013 වර්ෂයේදී අළුත්වැඩියා ආරම්භ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 දින වනවිට ඒ සඳහා රු. 4,639,631 ක් වැයකර තිබුණි. එහි අළුත්වැඩියා කටයුතු සම්පූර්ණයෙන් නිම නොකිරීම නිසා වර්ග අඩි 5600 ක් වූ එම මහලේ භූමි ප්‍රමාණය ආයතනය කිසිඳු කටයුත්තකට යොදාගත නොහැකිව 2017 ජූනි 23 වන විටත් නිෂ්ක්‍රියව පවත්වාගෙන ගොස් තිබුණි.

## 4.4 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

----------------------

ආයතනය වෙත ආරක්ෂක සේවය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබූ ලංසු මිල ගණන්වලින් අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් සේවාව ලබා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව 2016 ජූනි 04 දින තීරණය කර තිබුණද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් වැඩි මිල ගණන් යටතේ ආරක්ෂක සේවාවන් ලබා ගැනීමෙන් 2016 ජනවාරි සිට 2017 ජූනි 30 දින දක්වා ආයතනයට රු.5,168,194 ක අලාභයක් සිදුවී තිබුණි. තවද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (අ) වගන්තිය පරිදි රු. 500,000 ඉක්මවන කොන්ත්‍රාත් සඳහා විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවත් ආයතනය විසින් එම සේවාව ලබා ගැනීමේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමඟ ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2008 වර්ෂයේ දී බස්නාහිර පළාත් කාර්යාල හා සෙසු පළාත් කාර්යාල සඳහා 215 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණ ද වැටුප් පරිමාණ ඇතුලත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබුණි. ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 339 ක් වීමෙන් නිලධාරීන් 165 දෙනෙකුගේ අතිරික්තයක් හා නිලධාරීන් 41 දෙනෙකුගේ ඌනතාවයක් පැවතුණි.

(ආ) ආයතනය තුළ අතිරික්ත කාර්යමණ්ඩලයක් සිටියද ආයතනයේ පරිපාලන කටයුතු සඳහා අවශ්‍යවන සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන ගණකාධිකාරී තනතුරු පුරප්පාඩුව පැවතීම හේතුවෙන් පරිපාලන හා මූල්‍ය බලතල බෙදාහැරීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැන නැඟී තිබුණි.

(ඇ) ආයතනයේ අනුමත තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ස්ථිර නිළධාරීන් 124 දෙනෙකු බඳවාගෙන තිබියදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්, දෛනික වැටුප් හා අර්ධ කාලීන පැය පදනම යටතේ නිලධාරීන් 144 දෙනෙකු බඳවාගෙන තිබුණි.

(ඇ) ආයතනයේ අනුමත වෛද්‍ය නිලධාරී සංඛ්‍යාව 26 ක් වුවත් ඒ සඳහා වෛද්‍ය නිලධාරීන් 11 ක් පමණක් බඳවා ගෙන තිබුණු අතර වෛද්‍ය නිලධාරීන් 15 දෙනෙකුගේ පුරප්පාඩු ස්ථිර පදනමින් බඳවා නොගෙන වෛද්‍ය නිලධාරීන් 127 ක් කොන්ත්‍රාත් හා අනියම් පැය පදනම යටතේ බඳවා ගෙන තිබුණි. එමෙන්ම පුරප්පාඩුව පැවති වෛද්‍ය තනතුරු සඳහා විගණිත දිනය වූ 2017 ජුනි 07 වනවිටත් බඳවා ගැනීම් සිදුකර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-------------------------------------

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වර්ෂ අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 03 ක් ප්‍රමාද වී එනම් 2017 ජුනි 06 දින දීය.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

------------------------------

ආයතනයේ 2016 වර්ෂයේ අයවැයගත හා තථ්‍ය ආදායම් වියදම් සැසඳීමේදී ආදායම් විෂයයන් 18 කට අදාළව සියයට 11 සිට සියයට 373 දක්වා පරාසයක හා වියදම් විෂයයන් 34 කට අදාළව සියයට 11 සිට සියයට 396 දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | තොග පාලනය | හදිසි මිලදී ගැනීම් අවම වන පරිදි ඖෂධ සම්බන්ධව ප්‍රශස්ථ තොග මට්ටමක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | ආදායම් පාලනය | ආයතනයට අයත් දේපළ කුලී හා බදු පදනම මත ලබාදීමේදී විනිවිදභාවයෙන් යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කරමින් ආදායම් නියමිත කාලවලදී රැස් කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | වෛද්‍ය සහතික නිකුත් කිරීම. | සෑම ශාඛාවකම වෛද්‍ය සහතික නිකුත් කිරීමේ ජාලගත තොරතුරු පද්ධතියක් පවත්වා නොගැනීම. |
| (ඈ) | සේවක ණය පාලනය | චක්‍රලේඛ උපදෙස් අභිබවා ගෙවීම් කිරීමේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගෙන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ගෙවීම් කිරීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පරිපාලනය | සේවා ගිවිසුම් රහිතව පිරිසිදු කිරීම් හා ආරක්ෂක සේවා ලබා ගැනීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ආයෝජන | | ආයතනයේ අරමුදල් නිසි අනුමැතියකින් තොරව බාහිරව ආයෝජනය කිරීම හා ජංගම ගිණුම්වල අතිරික්ත මුදල් ඌන උපයෝජිතව පවත්වාගෙන යාම. |
| (උ) | වාහන උපයෝජනය | (i) | අදාළ මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| | | (ii) | ලොග් පොත් හා වාහන පිළිබඳ විස්තර පවත්වා නොගැනීම. |